# තිරිකුණාමලයේ මහ නාහිමියන්ගෙන් ධර්මපාල ප්‍රතිමාවක්



උරුමයක උල්පත හා පාත්ෆයින්ඩර් පදනම නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා පසුගියදා අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකායේ තිරිකුණාමලයේ ආනන්ද මහ නාහිමිපාණන් බැහැ දැක ආශිර්වාද ලබාගත්තේය.

අමරපුර නිකායාභිවෘද්ධි දයක සභාවේ ගිහි උපදේශක ධුරය හොබවන මිලින්ද මොරගොඩ මහතා සමග ආගමික පුනර්ජීවනය ඇති කිරීම සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡාවක් ද පැවැත්විණි.

රටට උදාර සේවාවක් ඉටු කළ අනගාරික ධර්මපාලතුමන්ගේ 156 වැනි ගුණානුස්මරණය නිමිත්තෙන් තිරිකුණාමලයේ ආනන්ද මහ නාහිමිපාණන් සිහිවටනයක් වශයෙන් ධර්මපාලතුමන්ගේ උඩුකය පිළිරුවක් පිරිනමන ලද අවස්ථාව.